# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

### ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| I | කොටස | - | 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ |
| II | කොටස | - | 3 ප්‍රශ්නය අනිවාර්ය වේ |
| III | කොටස | - | කැමති ප්‍රශ්න 02ක් පමණයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| I | කොටස | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 25 |
| | | | | | ලකුණු 45 |

| | | | | | |
|---|---|---|---|---|---|
| II | කොටස | - | 3 ප්‍රශ්නයට | - | ලකුණු 25 |

III කොටස - එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට - ලකුණු 30

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I කොටස | - | ලකුණු 45 |
| | | II කොටස | - | ලකුණු 25 |
| | | III කොටස | - | ලකුණු 30 |
| | | | | ලකුණු 100 |

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස (සා.පෙළ) - 2020
# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## *ආවරණය කෙරෙන ඉගෙනුම් පල*

## <u>I කොටස</u>

01.

I. අ, ආ - • වෙසක් පහන කෙටිකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

II. අ, ආ - • කුස ජාතක කතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

III. අ, ආ - • පද්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
• කාව්‍ය උපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

IV. අ, ආ - • නන්ද මහතෙරුන් වහන්සේගේ වස්තුවෙහි අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

V. අ, ආ - • තුංමංහංදිය නවකතාවේ අවස්ථා සම්බන්ධය ඉදිරිපත් කරයි.

02.

I. සිට V දක්වා

- පද්‍ය නිර්මාණවල අරමුණු හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

03. (i) සිට (iv) දක්වා

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂ ලක්‍ෂණ නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරින් පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට කතාවේ භාෂා උපක්‍රම හඳුනා ගෙන අගය කරයි.
- නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නැතහොත්**

03. (i) සිට (iv) දක්වා

- ජනකවිවලින් විවිධ හැඟීම් ප්‍රකාශ කර ඇති අයුරු අගය කරයි.
- ගැමියන්ගේ සිතුවිලි ජනකවිවලින් නිරූපණය වන අයුරු ඉදිරිපත් කරයි.
- ජනකවි රසවිඳිමින් විචාරයේ යෙදෙයි.

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# III කොටස

04.

- පද්‍ය නිර්මාණවල අරමුණ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- පද්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යෝපක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

05.

- ජාතක කතාවේ පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.
- කුස ජාතක කතාවේ කතා සාරය ඉදිරිපත් කරයි.
- කුස ජාතක කතාවේ චරිත ලක්ෂණ විග්‍රහ කර දක්වයි.
- කුස ජාතක කතාව රස විඳිමින් විචාරය කරයි.

06.

- සුභාෂිතයෙහි පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට පද්‍යවල ගැබ් වූ උපදේශ හා උපමා අලංකාර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට පද්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

07.

- නිර්දිෂ්ට නවකතාවේ පසුබිම විස්තර කරයි.
- තුංමංහංදිය නවකතාවේ ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- තුංමංහංදිය නවකතාව රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ................................................<br>................................................<br>................................................ | √ | △ 4/5 |
| (ii) | ................................................<br>................................................<br>................................................ | √ | △ 3/5 |
| (iii) | ................................................<br>................................................<br>................................................ | √ | △ 3/5 |
| (03) | එකතුව | ➡ | □ 10/15 |

Department of Examinations - Sri Lanka

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැකි ය . එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

Department of Examinations - Sri Lanka

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

> සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**
>
> **(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# 47- සිංහල සාහිත්‍ය රසාස්වාදය

## I කොටස

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කුඩුවක් හදමු"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(අ) ජී.බී. සේනානායක විසින් රචිත 'වෙසක් පහන' කෙටි කතාවේ අයියා / කථකයාගේ අයියා /අයියා

(ආ) ජී.බී.සේනානායක විසින් රචිත වෙසක් පහන කෙටි කතාවේ මල්ලීට / කථකයාට / බාල සහෝදරයාට /මල්ලීට

(ii) "මෑ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්ව"
(අ) මෙහි "මෑ" යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් විසින් ද?

(අ) කුස ජාතකයේ ප්‍රභාවතී දේවිය / පබාවතී දේවිය / මදු රජුගේ දියණිය / කුස රජුගේ බිසව

(ආ) කුස ජාතකයේ පබාවතියගේ පියා වන මදු රජු / පබාවතියගේ පියා / මදු රජු / සාගල රජු

(iii) "ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්,
'ඔබ'ය අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්"
(අ) 'විදුලියත් පැහැ පත් රන දම් සෙයින්' යන පද්‍ය ඛණ්ඩයෙහි අර්ථය ලියන්න.
(ආ) මෙම කවිය ඇතුළත් පද්‍ය නිර්මාණයේ කතුවරයා කවුද?

(අ) විදුලිය ද පැහැයෙන් යුතු (බබළන / දිදුලන) රන් මාලයක් ලෙසින්
(ආ) කුමාරතුංග මුනිදාස / කුමරතුඟුවන් / මුනිදාස කුමාරතුංග /කුමාරතුංග මහතා

(iv) "එසේ වී නම් දෙවඟනන් ලබන නියාවට මෙතරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(අ) නන්ද තෙරුන් වහන්සේ / නන්ද තෙරණුවෝ / නන්ද හිමි
(ආ) සද්ධර්මරත්නාවලිය

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) "... පුතාට ඕව දැන්ම බෑ. ඇඟිල්ල කැපෙයි. බලාගෙන ඉඳලා ඉගෙන ගන්ඩ"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(අ) මහගම සේකර විසින් රචිත තුංමංහංදිය නවකතාවේ අබිලිං / අබිලිං මාමා/ කථකයාගේ මාමා/ ලොකු මාමා

(ආ) මහගම සේකර විසින් රචිත තුංමංහංදිය නවකතාවේ කථකයාට / සිරිසේනට

*(ලකුණු 4 x 5 = 20යි)*

**2.** පහත දී ඇති පැදි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්න උපයෝගි කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

විචිරි චිරි චිචිරි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩි තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
පාර තොට, ගහ කොළ ද, වසා ගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන
අලුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුණ රෙදි ඇඟ ඇලුණ හබුරු කොළ මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුණ
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් විරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙදැයි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ළත වේ ය

(i) මෙම පද්‍ය පන්තියට පාදක වූ අද්දැකීම පැහැදිලි කරන්න.

I. මෙම පද්‍ය පන්තියට පාදක වී ඇත්තේ වර්ෂාව පිළිබඳ / වර්ෂා දිනයක් පිළිබඳ අද්දැකීමකි. වර්ෂාව හේතුවෙන් කථකයාට අත් විඳින්නට සිදු වූ පීඩා මෙමඟින් විස්තර වේ. මෙම අදහස ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

*(ලකුණු 05 යි.)*

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) මෙම අද්දැකීම රසවත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා කවියා තෝරා ගත් අවස්ථා හා සිද්ධි කවරේදැයි විස්තර කරන්න.

වර්ෂා දිනයක කථකයාට අත් විඳින්නට සිදු වූ පීඩා සහ වර්ෂා දිනයේ පරිසරයේ ස්වභාවය රසවත් ලෙස ඉදිරිපත් කිරීමට කවියා විවිධ සිද්ධි හා අවස්ථා යොදා ගෙන ඇත.

- පාර තොට, ගහ කොළ වසාගෙන වර්ෂාව ඇද වැටීම
- පාරේ මඩ වලවල් සෑදීම, ගමන් කිරීමට අපහසු වීම, ඇඳුම් ඇඟට ඇලීම
- වැහි වතුර ගලා ගොස් වක්කලං ඇලි හෑදීම
- පාරේ ගමන් කරන වාහනවල රෝදවලින් වතුර විසි වීම
- නිවසට ගොස් තෙත් වූ ඇඳුම් ඉවත් කොට පිරිසිදු වී උණුසුම් තේ පානය කිරීමට සිතා ළත වීම

***ඉහත අවස්ථා අතරින් අවම වශයෙන් තුනක්වත් ඇතුළත් කරමින් සාර්ථක පිළිතුරක් ඉදිරිපත් කර තිබිය යුතු ය. ඉහත අවස්ථා හා සිද්ධි සජීවී ආකාරයෙන් නිරූපණය කරමින් පාඨක මනසෙහි චිත්ත රූප මැවීමට කවියා සමත් ව ඇති ආකාරය පිළිතුරෙන් සනාථ කළ යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් (1x3 = 03)ලකුණු 03 යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 02 යි.***

***(ලකුණු 05 යි.)***

Department of Examinations - Sri Lanka

(iii) කවියා වැස්ස කෙරෙහි කුමන ආකල්පයක් දරන්නේදැයි පැහැදිලි කරන්න.

- මෙම පද්‍ය පන්තියේ කථකයා වැස්ස පිළිබඳ දක්වන්නේ යහපත් ආකල්පයක් නොවන බව පෙනේ.
- කථකයාට වර්ෂාව පීඩාවක් වී ඇති බව පද්‍ය පන්තියෙන් නිරූපණය වේ. එම පීඩාවෙන් අත් මිදීමට කථකයාගේ සිත ළත වේ.
- තම දෛනික කටයුතු කර ගෙන යාමට වර්ෂාව බාධාවක් බව කථකයා පවසයි.
- කථකයා වැස්ස කරදරයක් ලෙස සැලකූ බව;

  '' පොද නොකැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොළන...''

  '' වහින වැහි වහින වැහි නොපායන මුළු දවස...''

  '' ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන...''

  '' තෙමුණ රෙදි ඇඟ ඇලුණ...''

  '' ඔළුව කෙස් තෙත බරිව...''

  '' වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ළතවේ ය....''

  වැනි පද්‍ය යෙදුම්වලින් තහවුරු වේ.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

***මෙවැනි උදාහරණ හෝ අදාළ වෙනත් උදාහරණ තුනක්වත් ඇතුළත් කරමින් විස්තරාත්මක ලෙස පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් (1 x 3 = 03)ලකුණු 03 යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 02 යි.***

***(ලකුණු 05 යි.)***

(iv) මෙම පද්‍ය පන්තියේ සාර්ථකත්වය සඳහා කවියා යොදා ගත් භාෂාව ඉවහල් වී ඇති ආකාරය විමර්ශනයට ලක් කරන්න.

- 'වැස්ස' පද්‍ය පන්තියේ සාර්ථක බව සඳහා කවියා යොදා ගත් භාෂාව ඉවහල් වී ඇති බව පෙනේ.
- වර්ෂා දිනයක කථකයා අත් විඳි සිද්ධි හා අවස්ථා සජීවී ආකාරයෙන් නිරූපණය කිරීමට උචිත භාෂාවක් යොදා ගෙන තිබේ.
- එදිනෙදා ව්‍යවහාර වන කථන භාෂාවේ යෙදුම් ද භාවිත කර ඇත.

  උදා : '' උදේ සිට...''
  '' හිරිකිතෙන්...''
  '' නො පායන මුළු දවස...''
  '' විරි විරි ගාන...''
  '' දණිහ තෙක්...''
  '' තෙත බරිව...''
  '' හබුරු කොළ මලිපිටිද''
  '' කාර් රෝදෙන් චිරිස්...''
  '' ආයිමත් හිටි ගමන්...''
  '' ඇඳපු දේ මොහොතකින් ඉවර කොට...''
  '' උණට උණු තේ වතුර...''
- මෙවැනි යෙදුම් මගින් වර්ෂා දිනයක කථකයා අත් විඳින පීඩාව හා වර්ෂාව කෙරෙහි පවතින අකමැත්ත මෙන් ම නොරිස්සුම මනාව නිරූපණය වේ.
- එමෙන්ම මෙම පද්‍ය නිර්මාණයේ දී අනුප්‍රාසය වැනි ශබ්ද ධ්වනි උපයෝගී කර ගෙන ඇත.

  උදා : '' චිචිරි චිරි චිචිරි චිරි ''
  '' වහින වැහි වහින වැහි ''
- චිත්ත රූප මැවීමට සමත් භාෂාවක් යොදා ගෙන ඇත.
- වර්ෂා දිනයක සිදුවන අවස්ථා හා සිද්ධි සජීවී ආකාරයෙන් නිරූපණය කරමින් කථකයාගේ ආකල්ප මැනවින් හෙළි කිරීමට කවියා යොදා ගත් භාෂාව සමත් ව තිබේ.

***මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක ව පිළිතුර තහවුරු කර තිබිය යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් (1x 3 = 03 )ලකුණු 03 යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 02 යි.***

***(ලකුණු 05 යි.)***

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) ''කවියා යොදාගත් ආකෘතිය පද්‍ය පන්තියේ සාර්ථක බව සඳහා හේතු වී තිබේ ද?'' විමසන්න.

- ''වැස්ස'' පද්‍ය නිර්මාණය සඳහා රචකයා යොදා ගෙන ඇත්තේ ''පස්මත් විරිත'' සහිත නිදහස් ආකෘතියයි. ( නිසඳැස් ආකෘතිය ලෙස පිළිතුරෙහි සඳහන් කර තිබුණ ද ලකුණු ලබා දීම සුදුසු ය.)

- මෙම ආකෘතිය ඉවහල් කර ගෙන රිද්මයක් මතු වන අයුරින් වචන යොදා තිබේ.
- වර්ෂාවේ රිද්මය හා සජීවී බව ද එමඟින් මතු කර ගෙන ඇත.

උදා : '' චිව්රි චිරි... චිව්රි චිරි ''

'' වහින වැහි වහින වැහි ''

'' චිරි චිරි ගාන ''

'' කාර් රෝදෙන් චිරිස්.... ''

'' උණට උණු තේ වතුර... ''

***මෙවැනි උදාහරණ තුනක්වත් ඇතුළත් කරමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.***

- ***උදාහරණයකට ලකුණු 01 බැගින් (1 x 3 = 03)ලකුණු 03 යි.***
- ***අදාළ විස්තරයට ලකුණු 02 යි.***

***(ලකුණු 05 යි.)***

***(ලකුණු 5 X 5 = 25 යි.)***

Department of Examinations - Sri Lanka

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

**3.** නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් 'පාත්‍රය හැර ගත මැනව'යි නො කියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකැ යි සිතුහ. බුදුහු එතන දීත් පාත්‍රය හැර නොගත් සේක් හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ යි සිතා යන කලට එතන දීත් හැර නො ගන්නා රඳනු කැමැති වත් අභිප්‍රායකින් ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව යි කියා ගත නොහී මෙතන දී හැර ගන්නා සේක. මෙතන දී හැර ගන්නා සේක් වනැ යි සිතා ම නො සිතින් ගියත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

ඒ වේලෙහි නන්ද කුමරුවන්ගේ දනවු කලණ නම් වූ කුමාරයන්ට සරණ නිල වූ මුල් නෑ කම කවරේ වුවත් රජ කම් හෙයින් බැඳෑණියන් ළඟට මිනිස්සු ගොසින් බුදුහු පිය රජ්ජුරුවන්ගේ මාළිගාවට වැඩි ගමනේ මුඹදැගෙන් වෙන් කොට නන්ද කුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩනා සේකැ යි කිවු ය. එ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තෝ සෝධා නො නිමි හිස කේ නො බැඳ, වහා අවුත් 'ගියත් සුළු ගෙයි, වහා එව' යි කිවු ය. උන් කියා ලූ බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි, මහණ වවු දැ'යි වදාළ සේක.

බුදුන් වදාළ බස මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ උගුළුවා ලන්ට බැරි හෙයින් 'මහණ නො වෙමි'යි නො කියා 'යහපත මහණ වෙමි' කියා ගිවිස්සාහ.

(i) මෙම ඡේදයෙහි ඇතුළත් උපමා **දෙකක්** උපුටා දක්වන්න. (ලකුණු 05 යි.)

I. මෙම ඡේදයෙහි ඇතුළත් පහත සඳහන් කර ඇති උපමා ඒ ආකාරයෙන් ම උපුටා දක්වා තිබිය යුතු ය.

'' දිවුල් ලාටු මුසු වයිති තර ව වැද ගන්නා සේ ''


Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

'' මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ.... ''

යන පිළිතුරු ඉදිරිපත් කර තිබිය යුතු ය.

***එක් උපමාවක් පමණක් උපුටා ඇත්නම් ලකුණු 2ක් ද උපමා දෙකම උපුටා දක්වා ඇත්නම් ලකුණු 05ක් ද පිරිනමන්න.***

***(ලකුණු 05යි.)***

(ii) නන්ද කුමරු බුදුන් වහන්සේ පසුපස ගියේ කුමක් සඳහා ද? (ලකුණු 05 යි.)

නන්ද කුමරු බුදුන්වහන්සේ පසුපස ගියේ බුදුන්වහන්සේ කෙරෙහි මහත් ගෞරවයෙන් පාත්‍රය බුදුන්වහන්සේට ලබා දීමේ අරමුණෙනි. බුදුන්වහන්සේ නන්ද කුමරු අතට පාත්‍රය ලබා දුන්නේ, විහාරයට කැටුව ගොස් කුමරු පැවිදි කරවීමේ අරමුණ පෙරදැරිව ය. මෙම අදහස පිළිතුරෙහි සවිස්තර ලෙස ඇතුළත් කර තිබිය යුතු ය.

- 'බුදුන්වහන්සේට පාත්‍රය ලබා දීම සඳහා' යන අදහස ඇති කෙටි පිළිතුර පමණක් සපයා ඇත්නම් ලකුණු 02ක් ද
- සවිස්තර පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 05ක් ද පිරිනමන්න.

***(ලකුණු 05 යි.)***

(iii) 'ගියත් සුළු ගෙයි, වහා එව'යි ජනපද කල්‍යාණිය පැවසීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

ජනපද වැසි මිනිස්සු වහා ගොස් බුදුරජාණන් වහන්සේ පිය රජතුමාගේ නිවසට වැඩම කළ අවස්ථාවේ දී නන්ද කුමරු අතට පාත්‍රය දී, නන්ද කුමරු කැඳවා ගෙන යන බව ජනපද කල්‍යාණියට පැවසූහ. එය ඇසූ ජනපද කල්‍යාණිය සෝදා නිම නො වූ කෙස් ඇති ව කලබලයෙන් දුවගෙන විත්, විවාහ මංගල්‍යයට ද දින නියම කොට සිටි තම අනාගත සහකරු හදිසියේ යළි නොපැමිණියහොත් තමාට අත්වන ඉරණම පිළිබඳ සැකයෙන්, ඇය මෙසේ පවසා සිටියා ය. එසේ ම බුදුරදුන්, තම අනාගත සැමියා පැවිදි කරවීමේ අරමුණෙන් මෙසේ කැටුව යන්නේ ය යන සාධාරණ සැකය ද ඇය තුළ ඉපිද තිබූ නිසා ''වහා එන්න'' යැයි පැවසූ බව අවධාරණය කළ හැකි ය.

***මෙම අදහස සවිස්තරාත්මක ලෙස පිළිතුරෙහි ඇතුළත් වී තිබිය යුතු ය.***

- ***'නන්ද කුමරු නැවත කැඳවීම සඳහා' යන අදහස ඇති කෙටි පිළිතුර පමණක් සපයා ඇත්නම් ලකුණු 02ක් ද***
- ***සවිස්තර පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 05ක් ද පිරිනමන්න.***

***(ලකුණු 05 යි.)***


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iv) සද්ධර්මරත්නාවලියේ කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති ආකාරය ඉහත ඡේදය ඇසුරෙන් විමසන්න.

සද්ධර්මරත්නාවලියේ කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති ආකාරය මෙම ඡේදය ඇසුරෙන් ප්‍රකට කළ හැකි ය. පාඨකයාට කුතුහලය ඇති කරවමින් නාටකීය අවස්ථා කිහිපයක් කතුවරයා රූපණය කර ඇත්තේ ය.

බුදුන්වහන්සේ සමඟ නන්ද කුමරු පාත්‍රය ද රැගෙන යන අවස්ථාව නිරූපණය කර ඇත්තේ නාට්‍යාකාරයෙනි. බුදුන්වහන්සේ සිය පාත්‍රය හිණි හිස කෙරෙහි දී අරගනියි යැයි නන්ද කුමරු සිතයි. එතැනදී ද පාත්‍රය බුදුරදුන් හැර නොගත් විට නන්ද කුමරු සිතනුයේ හිණි පාමුල දී එය ගනු ඇතැයි කියා ය. එහෙත් එතැන දී ද බුදුරදුන් පාත්‍රය ලබා ගන්නේ නැත. බුදුන් කෙරෙහි අපමණ ගෞරවයෙන් නන්ද කුමරු පාත්‍රය ''මෙතන දී ගනු ඇතැයි'', ''මෙතන දී ගනු ඇතැයි'' සිතමින් පසු පසින් ගමන් කරන ආකාරය සජීවී නාට්‍යයක ආකාරයෙන් කතුවරයා රූපණය කර ඇත්තේ ය.

නන්ද කුමරු පාත්‍රයකුත් රැගෙන බුදුන්වහන්සේ පසු පසින් යන බව මිනිසුන්ගෙන් දැන ගත් ජනපද කල්‍යාණිය එම අවස්ථාවේ දී ක්‍රියා කරන ආකාරය නිරූපණය කර ඇත්තේ ද නාටකීය විලාසයකිනි. තම අනාගත සහකරු බුදුරදුන් සමඟ යන බව ඇසූ ඇය වඩාත් කලබලයට පත් වූවාය. ඔහු යළිත් නොපැමිණිය හොත් තමාට අත්වන අඳුරු ඉරණම පිළිබඳ භීතියක් ඇයට ඇති විය.

ජනපද කල්‍යාණිය ඒ අවස්ථාවේ සිටියේ ජලස්නානය කරමිනි. හිස සෝදමින් සිටි ඇය එම කාර්යය ද අතරමග නවතා හිස කේ නොබැඳ විත් '' ගියත් සුළුගෙයි වහා එව'' යි. නන්ද කුමරුට පැවසුවා ය. ඉතා සංවේදී අවස්ථාවක් නාටකීය ගුණයෙන් යුතු ව චිත්‍රණය කිරීමට මේ අවස්ථාවේ දී කතුවරයා ප්‍රයත්න දරා ඇති බව පැහැදිලි ය.

***මෙවැනි නාටකීය අවස්ථා ඇතුළත් වන සේ සවිස්තරාත්මක ලෙස පිළිතුරු ඉදිරිපත් කර තිබිය යුතුය.***

- ***නාටකීය අවස්ථා 3ක් සඳහන් කර ඇත්නම් (1 X 3 = 03) ලකුණු 03යි.***
- ***එම අවස්ථා විස්තර කර ඇත්නම් (2 X 3 =6) ලකුණු 06යි.***
- ***නිවැරදි භාෂා විලාසය හා පිළිතුරෙහි ප්‍රමාණවත් බව සඳහා ලකුණු 01යි.***

***(ලකුණු 10 යි.)***

***(ලකුණු 5 + 5+ 5+ 10 = 25 යි.)***

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**නැතහොත්**

රිදියෙන් තනලා රත්රන් ඔබලා කැරලි කෙටුවයි          දැකැත්තේ
සුරතට රන්වන් රැලි නංවා ලා කදිමට දිලිසෙයි          දැකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට සබයෙන් අවසර          ලැබගත්තේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි          දැකැත්තේ

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර          වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ          වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර          වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත          වාගේ

ලස්සන හිමවතේ මා වී          පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා          හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත්          බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල්          රකින්නේ

කන්ද උඩින් එන කිකිළිය          ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු          කැටියේ
අත පාමුදු පය පාමුදු          වයිරෝඩියේ
මට පිටුපා ගෙට යනවද          සුරතලියේ

බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ          ගෙට
මැනලා වී දෙකක් දුන්නයි          මල්ලකට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි          මට
මැනල ද පුතේ කිරි දුන්නේ මං          නුඹට

දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්ඩ යන හැටි බලන්          කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි          කලූ
දහසක් දීලා වළලු තනාලා දැතේ අතලා බලයි          කලූ
දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන්          කලූ

(i) මෙම පද්‍ය මගින් නිරූපණය වන කෘෂිකර්මාන්තයේ අවස්ථා **දෙකක්** නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.          (ලකුණු 05 යි.)

- ජනකවිය සඳහා විවිධ අද්දැකීම් පාදක වන අතර එහි දී කෘෂිකර්මාන්තයේ අවස්ථා විශේෂ වේ.
- මෙම ජනකවි නිර්මාණ සඳහා කවියා කෘෂිකර්මාන්තයේ වී ගොවිතැනට සම්බන්ධ අවස්ථා යොදා ගෙන තිබේ.
- ''ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ'' යන ජනකවියෙන් වී ගොවිතැනෙහි එන පැල් රැකීමේ අවස්ථාව නිරූපණය කර තිබේ.
- එහි දී වී ගොවිතැනේ දී ගැමියාට අත් විඳින්නට සිදු වූ දුක් ගැහැට මෙන් ම ස්වාභාවික උවදුරුවලින් ඇතිවන පීඩා ද මැනවින් නිරූපණය කරයි.
- ගොයම් කැපීමේ සහ නෙළීමේ අවස්ථාව;
  '' රිදියෙන් තනලා රත්රන් ඔබලා.... ''
  '' ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත... ''
  යන කවිවලින් නිරූපණය කර තිබේ.
- කෘෂිකර්මාන්තයේ දී ගැමියා අනුගමනය කළ පුද පූජා හා සිරිත් විරිත්, දේව විශ්වාස ආදිය මෙම කවිවලින් මැනවින් නිරූපිත ය.
- විවිධ දුක් ගැහැට මැද ආරක්ෂා කර ගත් වී අස්වැන්න නෙළා ගන්නා අවස්ථාවේ ඇතිවන ප්‍රීතිය ද මෙමගින් නිරූපිතය.

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

***ඉහත උදාහරණ හා අදහස් ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතුය.***

- ***සුදුසු උදාහරණ 2ක් සඳහන් කර ඇත්නම් (1 X 2 = 02) ලකුණු 02යි.***
- ***අදාළ විස්තරය සඳහා ලකුණු 03යි.***

***(ලකුණු 05 යි.)***

(ii) කවියා යොදා ගත් භාෂාවේ විශේෂතා **දෙකක්** නිදසුන් සහිත ව අගයන්න.

- ජනකවි සඳහා යොදා ගෙන ඇති භාෂාව ගැමියාට ම අනන්‍ය වූවකි.
- ජනකවි බසෙහි විශේෂතා කිහිපයක් හඳුනා ගත හැකි ය.

(i) සරල බව

උදාහරණ : " දොඩම් කපාලා ඇඹුල් තනාලා "
" දහසක් දීලා වළලු තනාලා "
" කන්ද උඩින් එන කිකිළිය... "

(ii) කටවහර / ගැමි වහර

උදාහරණ : " මට පිටුපා ගෙට යනවද සුරතලියේ "
" දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ "
" ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට "

(iii) ගැමි පරිසරයෙන් ගත් උපමා / රූපක භාවිතය

උදාහරණ : උපමා
" දුනුකේ මල සේ "
" ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ "

රූපක
" දාඩිය මුතු "

(iv) අනුප්‍රාසවත් බස හා එළි වැට භාවිතය

උදා : " ඉරට ඉරක් නැත "
" සඳට සඳක් නැත "
" අත පාමුදු පය පාමුදු "

***ජන කවි බසෙහි මෙවැනි විශේෂතා දෙකක් නිදසුන් සහිත ව විස්තර කරමින් පිළිතුරු ඉදිරිපත් කළ යුතු ය.***

- ***ජන කවි බසෙහි විශේෂතා 02ක් සඳහන් කර ඇත්නම් (1 X 2 = 02) ලකුණු 02 යි.***
- ***එම භාෂා විශේෂතා තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් උදාහරණ සහිත ව විස්තර කර ඇත්නම් ලකුණු 03 යි.***

***(ලකුණු 05 යි.)***

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) එදිනෙදා ජීවිතයේ කටුක අද්දැකීම් කවියා නිරූපණය කළ ආකාරය ඉහත කවිවලින් නිදසුන් **දෙකක්** සපයමින් පැහැදිලි කරන්න.

- ගැමි ජනතාවට තම එදිනෙදා ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන කටුක අද්දැකීම් ජන කවි සඳහා පාදක කර ගෙන තිබේ.
- දිළිඳුකම හා පාරිසරික සාධක හේතුවෙන් ගැමියාට අත්විඳින්නට සිදු වූ විවිධ දුෂ්කරතා මෙන් ම ඔහුගේ ජීවිතයේ දුක්ඛ දෝමනස්ස ඉතා නිර්ව්‍යාජ ආකාරයෙන් ප්‍රකාශ කිරීමට ජනකවි ඉවහල් කර ගෙන ඇත.
- ගැමියාගේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තයේ දී ඔහු අත්විඳි දුක් පීඩා නිරූපණය කර ඇති අවස්ථාවකට නිදසුන් ලෙස;

  '' ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
  දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
  රැක්මෙන දෙවියනේ වෙල බත් බුදින්නේ
  දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ ''

  යන කවිය දැක්විය හැකි ය.

- දිළිඳුකම හේතුවෙන් ගැමියා අත් විඳි පීඩා හා මානව සම්බන්ධතා දෙදරා යන ආකාරයට නිදසුන් ලෙස;

  '' බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
  මැනලා වී දෙකක් දුන්නයි මල්ලකට
  ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට
  මැනලද පුතේ කිරි දුන්නේ මං නුඹට ''

  යන කවිය දැක්විය හැකි ය.

Department of Examinations - Sri Lanka

***ඉහත උදාහරණය ඇතුළත් වන සේ සවිස්තර පිළිතුරක් ඉදිරිපත් කළ යුතු ය.***

- ***සුදුසු නිදසුන් 02ක් දක්වා ඇත්නම් (1 X 2 =02) ලකුණු 02 යි.***
- ***අදාළ විස්තරය සඳහා ලකුණු 03 යි.***

***(ලකුණු 05 යි.)***

(iv) ''ගැමියා සහ පරිසරය අතර පැවති බැඳීම මෙම පද්‍ය මඟින් නිරූපණය වේ.'' නිදසුන් **තුනක්** දක්වමින් විමසන්න.

- ගැමියා සහ පරිසරය අතර පැවතියේ සමීප සම්බන්ධතාවකි.
- නිරතුරු ව පරිසරය හා ගැටෙමින් ස්වාභාවික පරිසරයෙන් ලැබූ පීඩා ජන කවියා අව්‍යාජ ලෙස ප්‍රකාශ කරයි.

  උදා : '' ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
  දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ ''


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- ස්වාභාවික පරිසරයේ සුන්දරත්වයෙන් ගැමියා අත් විඳි චමත්කාරය ද ජන කවියෙහි නිරූපිත ය.

  උදා : '' ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ ''

- ස්වාභාවික පරිසරයෙන් ලබා ගත් දේ තම එදිනෙදා ජීවිතයට ඉවහල් කර ගත් ආකාරය ජන කවියෙන් ප්‍රකට වේ.

  උදා : '' දොඩම් කපාලා ඇඹුල් තනාලා......... ''

- ගැමි පරිසරය හා බැඳුණු ඇදහිලි විශ්වාස හා ජනක්‍රීඩා පිළිබඳ ව ජන කවියෙහි අන්තර්ගත වේ.

  උදා : '' සතර වරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි දැකැත්තේ ''

  '' දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන් කලූ ''

***මෙවැනි උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක ව පිළිතුරු සපයා තිබිය යුතු ය.***

- ***උදාහරණ 03ක් සපයා ඇත්නම් (1 X 3 = 3) ලකුණු 03 යි.***
- ***එම උදාහරණවලට අදාළ විස්තරය සඳහා (3 X 2 = 06) ලකුණු 06 යි.***
- ***නිවැරදි භාෂා භාවිතය සහ පිළිතුරෙහි ප්‍රමාණවත් බව සඳහා ලකුණු 01යි.***

***(ලකුණු 10 යි.)***

***(ලකුණු 5 + 5+ 5+ 10 = 25 යි.)***

Department of Examinations - Sri Lanka

**III කොටස**

මෙම කොටසෙන් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන **150ට නො අඩු** විය යුතු ය.)

4. සංවේදී සිදුවීම් සියුම් ලෙස නිරූපණය කිරීමට, ඇත්ගාලේ දරු පෙම පද්‍ය පන්තියේ කතුවරයා දැක්වූ කුසලතාව නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් රචනා කරන ලද **ඇත් ගාලේ දරු පෙම** පද්‍ය නිර්මාණය සංවේදී සිදුවීමක් පාදක කරගත්තකි.
- ඇත් ගාලක සිර වූ ඇත් පැටවෙකු සහ සිය මව අතර ඇති වන සංවාදයක ස්වරූපයෙන් පද්‍ය පන්තිය ඉදිරිපත් කර ඇත.
- මිනිසුන්ගෙන් සතුන්ට සිදුවන පීඩා ඉතා සංවේදී ආකාරයෙන් නිරූපණය කරයි.
- මෙහි ඇත් මවට හා ඇත් පැටවාට උචිත වාංමාලාවක් යොදා ගැනීම මෙම නිර්මාණයේ විශේෂත්වයකි.

  උදා : '' මොකටද අම්මේ අම්මට ගැහුවේ... ''

  '' ඇඟපත තැළිලා රිදෙනවා ඇතිනේ... ''

  '' බඩගිනි එනවා නිදිමත එනවා... ''

  '' අනේ පුතේ මට කන්න බොන්න නෑ
  ඒ හින්දා නෑ කිරි එරුණේ ''

  '' අන්න අන්න අපේ නායකයා අද


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ලේ දාගෙන බිම පෙරළෙනවා ''
'' දුටුවද අම්මේ පොර කාගෙන ඇද
වලිගේ ලොම් ගලවා ගනිතී ''

මෙම උදාහරණ හෝ වෙනත් අදාළ උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සංවේදී සිදුවීම් සියුම් ලෙස නිරූපණය කරමින් පිළිතුර සවිස්තරාත්මක ලෙස ඉදිරිපත් කළ යුතු ය.

- ***අදාළ උදාහරණ සඳහා, එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (2 X 3 = 6)***
- ***එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් (2 X 3 = 06) ලකුණු 06 යි.***
- ***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.***
- ***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01 යි.***

***(ලකුණු 15 යි.)***

5. ජාතක කතා කතුවරයාගේ අවස්ථා නිරූපණ හැකියාව කුස ජාතකය ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** දෙමින් අගයන්න. (ලකුණු 15 යි.)

- ජාතක කතාවේ විවිධ අවස්ථා මැනවින් නිරූපණය කිරීමට කුස ජාතක කතුවරයා දැක්වූයේ විශේෂ දක්ෂතාවකි.
- කුස ජාතකය සජීව ගුණයෙන් යුතු සාර්ථක නිර්මාණයක් බවට පත් වීමට මෙය ප්‍රබල හේතුවක් වී තිබේ.
- කුස ජාතකයේ ඇතුළත් වන;
  - සීලවතී බිසවට කුස කුමරු පිළිසිඳ ගත් අවස්ථාව
  - කුස කුමරුට විවාහය සඳහා සුදුසු කුමාරිකාවක සෙවීමේ අවස්ථාව
  - කුස හා පබාවතිය අතර විවාහය
  - කුස කුමරු පබාවතියට කරන උසුළු විසුළු
  - පබාවතිය නැවත සාගල පුරයට යාම
  - කුස රජු, සාගල පුරයට ගොස් අප්‍රකට ව සිටිමින් පබාවතිය නැවත දිනා ගැනීමට කරන උත්සාහය
  - සත් රජ දරුවන් සාගල පුරය වටලෑම
  - කුස රජුගේ ජයග්‍රහණය

***යන ප්‍රධාන සිද්ධි හා ඒවාට අදාළ අනුසිද්ධි සහ අවස්ථා අතරින් අවම වශයෙන් තුනක්වත් ඇතුළත් වන සේ සවිස්තරාත්මක ව පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය. එම සිද්ධි හා අවස්ථා මගින් මතු කෙරෙන රසය පිළිතුරෙහි අන්තර්ගත විය යුතු ය.***

- ***අදාළ උදාහරණ සඳහා, එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (2 X 3 = 6)***
- ***එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් (2 X 3 = 06) ලකුණු 06 යි.***
- ***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.***
- ***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.***

***(ලකුණු 15 යි)***

Department of Examinations Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**6.** සුභාෂිතය කතුවරයා උපමා ඇසුරෙන් සදුපදේශ ලබා දීමට ගත් උත්සාහය නිදසුන් **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- **සුභාෂිතය** කෘතියෙහි කතුවර අලගියවන්න මුකවෙටිතුමා ස්වකීය කාව්‍ය ග්‍රන්ථය මගින් සදුපදේශ ලබා දීමට ප්‍රයත්න දරා ඇත.
- ඒ සඳහා කතුවරයා තෝරා ගෙන ඇත්තේ උපමා මගින් සදුපදේශ ලබා දීමේ කාව්‍ය රචනෝපක්‍රමය යි.

  උදා : '' පසක් රාහු මුව පත් වෙමිනි බිය කර ''

  '' එක පුත් සඳින් දුරු වෙයි ලොව ගන අඳුරු ''

  '' කලල ගිලුණු මත වරණිඳු ගොඩ ගනුත... ''

  '' නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු ''

  වැනි උපමා යොදා ගත් අවස්ථා තුනක්වත් අවම වශයෙන් ඇතුළත් වන සේ පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

  කවියේ පදාර්ථ පැහැදිලි කිරීම පමණක් ප්‍රමාණවත් නො වන අතර ඒ ඒ උපමා හා උපමේය පිළිබඳ ව මනා අවබෝධය ද එමගින් ලබා දෙන සදුපදේශ හා කවියෙන් මතු කෙරෙන රසය ද පිළිතුරෙන් ප්‍රකට විය යුතු ය.

- ***අදාළ උදාහරණ සඳහා, එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (2 X 3 = 6)***
- ***එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් (2 X 3 = 06) ලකුණු 06 යි.***
- ***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.***
- ***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.***

***(ලකුණු 15 යි)***

Department of Examinations - Sri Lanka

**7.** ''සිරිසේන තම කලා හැකියාවන් පෝෂණය කර ගත්තේ අබිලිං මාමා ආදර්ශයට ගැනීමෙන් ය.'' තුංමංහංදිය නවකතාව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

- මහගම සේකර විසින් රචනා කරන ලද **තුංමංහංදිය** නවකතාවේ කථකයා වන සිරිසේන කලා හැකියාවන්ගෙන් අනූන තරුණයෙකු ලෙස ගොඩනැගෙන ආකාරය නිරූපණය කර තිබේ.
- සිරිසේනට තම කුඩා අවධියේ සිට ම ඔහුගේ ලොකු මාමා වන අබිලිංගේ ඇසුර නොමඳ ව ලැබීම ඔහු ලද භාග්‍යයකි.
- අබිලිං මාමා දක්ෂ ගැමි කලාකරුවෙකු ලෙස නවකතාවේ නිරූපිත ය.
- සිරිසේනගේ කලා හැකියාවන් පෝෂණය කර ගැනීමට අබිලිං මාමාගේ ආදර්ශය හා මග පෙන්වීම ඉහවල් වූ ආකාරය නවකතාවේ බොහෝ සිද්ධි හා අවස්ථා මගින් නිරූපණය කර තිබේ.
- අබිලිං දක්ෂ කඩදාසි කැටයම් කැපීමේ ශිල්පියෙකු වූ අතර ඔහු ජීවත් වූ ගම් ප්‍රදේශයෙහි මඟුල් මඩු සැරසීම වැනි කටයුතු බොහොමයක් සිදු වන්නේ අබිලිං අතිනි.
- විවිධ හැඩයෙන් යුතු අකුරු අතින් ඇඳීමේ විශේෂ හැකියාවක් අබිලිං සතු වූ අතර විවිධ පුවරු ඇඳීමත් කරත්ත, ලොරි ආදිය වර්ණ ගැන්වීමත් අබිලිං අතින් සිදු විය.
- අබිලිං මාමා විසින් සිදු කෙරුණු මෙවැනි බොහෝ කලා කටයුතු නිරීක්ෂණය කිරීමටත් එම කටයුතුවල දී අබිලිං මාමාට සහාය වීමටත් සිරිසේනට කුඩා කල සිට ම අවස්ථාව හිමි වේ.



Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

- අබිලිං මාමා අනුව යමින් සිරිසේන ද තම හැකියාව අනුව වෙසක් පත් ඇඳීම හා බැනර් ඇඳීම වැනි දේ සිදු කිරීම .
- මෙය සිරිසේනට තම කලා හැකියා ඔපවත් කර ගැනීමට මහඟු අවස්ථාවක් විය.

***අවම වශයෙන් මෙවැනි අවස්ථා තුනක්වත් ඇසුරෙන් සවිස්තරාත්මක ලෙස පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.***

- ***අදාළ උදාහරණ සඳහා, එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (2 X 3 = 6)***
- ***එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් (2 X 3 = 06) ලකුණු 06 යි.***
- ***භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.***
- ***නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.***

***(ලකුණු 15 යි.)***

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/